මධ්‍යම සංස්කෘතික අරමුදල
மத்திய கலாசார நிதியம்
CENTRAL CULTURAL FUND

බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය
புத்த சாசன, மத விவகார மற்றும் கலாசார அமைச்சு
Ministry of Buddhasasana, Religious & Cultural Affairs

මගේ අංකය / எனது இல / My No: CCF/DG/GEN/2023    ඔබේ අංකය / உமது இல / Your No.: ....................    දිනය / திகதி / Date: 2023/02/28

212/1 බෞද්ධාලෝක මාවත කොළඹ 07, 212/1 பௌத்தாலோக மாவத்தை கொழும்பு 07, 212/1 Bauddhaloka MW. Colombo -7,

අධ්‍යක්ෂ ජනරාල්,
පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
තැ.පෙ. අංක 532,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,
කොළඹ 07.

**<u>රජගල පුරාවිද්‍යා පරිශ්‍රය සඳහා නව සංචාරක ප්‍රවේශ පත්‍රය නිකුත් කිරීම.</u>**

ඔබගේ අංක Arch/HO/PMD/28(2022/23) හා 2023.01.27 දිනැති ලිපිය හා බැඳේ.

2. ඒ අනුව, රජගල පුරාවිද්‍යා පරිශ්‍රයේ ආදායම් ඉපයීම් සඳහා ක්‍රමවේදයක් සකස් කොට ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යම සංස්කෘතික අරමුදල විසින් කටයුතු සූදානම් කර ඇත.

3. ඓතිහාසික පුරාවිද්‍යා ස්මාරක රාශියකින් යුත් මෙම පුරාවිද්‍යා භූමිය සංචාරක කර්මාන්තය උදෙසා වඩාත් සාධනීය ව ප්‍රවේශ කළ හැකි විභවතාවන්ගෙන් යුත් පරිශ්‍රයක් ලෙස හඳුනා ගෙන ඇති බැවින්, පසුගිය වසර කිහිපය මුළුල්ලේ පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දියත් කරන ලද පුරාවිද්‍යාත්මක පර්යේෂණ හා උරුම කළමනාකරණ වැඩසටහනේ වර්ධනීය ඉදිරි පියවරක් ලෙස රජගල පුරාවිද්‍යා පරිශ්‍රය දෙස් හා විදෙස් සංචාරකයන් උදෙසා විවෘත කිරීමට අවශ්‍ය කටයුතු මේ වනවිට සූදානම් කර ඇත.

4. මෙම පුරාවිද්‍යා පරිශ්‍රය නැරඹීමට පැමිණෙන සංචාරකයන් උදෙසා අප ආයතනය මගින් පහත මිළ ගණන් පරිදි ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමට නියමිත ය.

| | |
|---|---|
| දේශීය වැඩිහිටි | - 50 LKR |
| දේශීය ළමා | - 30 LKR |
| විදේශීය වැඩිහිටි | - 5 USD |
| විදේශීය ළමා | - 2.5 USD |
| සාක් කලාපීය රටවල් සඳහා | - 2.5 USD |

5. ඒ අනුව රජගල පුරාවිද්‍යා පරිශ්‍රය සඳහා නව සංචාරක ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම 2023.03.03 වන දින ආරම්භ කිරීමට නියමිතව ඇත. මෙම ක්‍රියාවලිය පිළිබඳව ඔබතුමාව කාරුණිකව දැනුවත් කරමි.

මහාචාර්ය පුරාවිද්‍යාඥ ගාමිණී රණසිංහ
අධ්‍යක්ෂ ජනරාල්
මධ්‍යම සංස්කෘතික අරමුදල

පිටපත් -:
ලේකම් (සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය) - කාරුණික දැන ගැනීම සඳහා
සභාපති (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය) - කාරුණික දැන ගැනීම සඳහා
සභාපති (ශ්‍රී ලංකා සංචාරක ව්‍යාපාර ප්‍රවර්ධන කාර්යාංශය) - කාරුණික දැන ගැනීම සඳහා